සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# අවසාන වාර පරීක්ෂණය 2016

11 ශ්‍රේණිය **ඉතිහාසය - I** කාලය පැය 01 යි.

| නම/ විභාග අංකයඃ |
|---|

සැලකිය යුතුයි :
- සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 80 ක් හිමිවේ.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්න වල දී ඇති 1, 2, 3, 4 පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

01. ඇම්බැක්කේ දේවාලයේ ගල් කණුවල ලියූ ලේඛන අයත් වන්නේ මින් කුමන වර්ගයේ මූලාශ්‍ර වලට ද?
(1) නටඹුන් (2) නාණක මූලාශ්‍ර (3) අභිලේඛන (4) කැටයම්

02. ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමට ඉවහල් වූ විදේශීය මූලාශ්‍රයක් වන භූගෝල ශාස්ත්‍ර ප්‍රවේශය නම් කෘතිය ලියූ භූගෝල ශාස්ත්‍රඥයා පහත දී ඇති පිළිතුරු අතරින් තෝරන්න.
(1) ක්වේරොස් පියතුමා (2) ඇරිස්ටෝටල් (3) ප්ලිනි (4) ක්ලෝඩියස් ටොලමි

03. ශ්‍රී ලංකාව ජනාවාස කිරීම සඳහා දායක වූ ආදී කාලීන මානවයා කවුරුන්දැයි පහත සඳහන් මානවයින් අතරින් තෝරන්න.
(1) හොමෝ හැබිලස් (2) හොමෝ ඉරෙක්ටස් (3) හොමෝ සාපියන් (4) හොමෝ නියන්ඩතාලිස්

04. මෙරට ගල් යුගයේ තාක්ෂණය පිළිබඳව විස්තරාත්මක දැනුමක් ලබාගැනීමට ඉවහල් වන්නේ කුමන මෙවලම් වර්ගය ද?
(1) ජ්‍යාමිතික ක්‍ෂුද්‍ර මෙවලම් (2) මැටි භාජන
(3) මිටි (4) ඇඹරුම් ගල්

05. පැරණි සෙල්ලිපි වල 'පරුමකලු' නමින් හඳුන්වා ඇත්තේ කවුරුන් ද?
(1) වැව් පාලනයට සම්බන්ධ අය (2) ප්‍රාදේශීය පාලනයට සම්බන්ධ කාන්තාවන්
(3) ගම් පාලනයට සම්බන්ධ අය. (4) ගම් කීපයක් පාලනය කළ අය.

06. රාජ්‍යත්ව සංකල්පය වර්ධනය වීමේදී පැරණි රජවරු විවිධ ස්වරූප වලින් පෙනී සිටීමට උත්සාහ දරා ඇත. මෙලෙස ලංකා ඉතිහාසයේ කුවේරයකු ලෙස පෙනී සිටීමට උත්සාහ දැරූ රජතුමා කවුද?
(1) පණ්ඩුකාභය (2) කාශ්‍යප (3) දුටුගැමුණු (4) මහසෙන්


07. ක්‍රි.ව. නව වන සියවසේ ලියවුන සෙල්ලිපි වල 'එක්තැන්සමිය' යන වචනය භාවිතා කර ඇත්තේ කුමන පාලන ආයතනය හැඳින්වීමටද?
(1) ව්‍යවස්ථාදායකය හා විධායකය (2) භාණ්ඩාගාරය
(3) සභාව (4) අධිකරණය

08. ශ්‍රී ලංකා ආර්ථිකයේ එක්තරා ක්ෂේත්‍රයක කටයුතු දැක්වීමට පහත සඳහන් අක්ෂර වලින් දැක්වෙන වචන භාවිතා විය. මෙම වචන භාවිතා වූ ක්ෂේත්‍රය කුමක් ද?
A කාල සුමන B පූගය C වාපර D නියමස්ථාන
(1) කෘෂිකර්මය (2) වෙළඳාම (3) කර්මාන්ත (4) සත්ව පාලනය

09. ශ්‍රී ලංකාවේ පැරණි තාක්ෂණයේ දී 'පීඩන ශල්කනය' යන වචනය භාවිතා කළේ කුමන කාර්යක් සම්බන්ධයෙන් ද?
(1) සකපෝරුවේ දමා මැටි පදම් කිරීම.
(2) වෙර යොදා ගල්පතුරු ගලවා මෙවලම් තැනීම.
(3) ලඹයක් භාවිතා කර බිත්ති බැඳීම.
(4) මැටි නලයක් තුළින් සොහොන් ගර්භයට ඔක්සිජන් වායුව ලබා දීම.

10. 'දිවුල් මැලියම් තවරන ලද ලෝහ දැලක් මත තල තෙල්වලින් තෙමන ලද රන්සිරියල් ගල් ඇතිරවීම.' ඓතිහාසික මූලාශ්‍ර වල ඉහත ප්‍රකාශය සඳහන් වන්නේ කුමන ගොඩනැගිල්ලක අත්තිවාරම ඉදිකිරීම සම්බන්ධයෙන් ද?
(1) මිරිසවැටිය (2) අභයගිරිය (3) රුවන්වැලි සෑය (4) නිල්ලක්ඛම බෝධිඝරය

11. පහත පින්තූරයේ දක්වෙන්නේ නෙදර්ලන්තයේ හේග් නුවර පිහිටා ඇති එක්සත් ජාතීන්ගේ ප්‍රධාන ආයතන වලින් එකකි. ඒ කුමන ආයතනය ද?



(1) මහා මණ්ඩලය
(2) අන්තර්ජාතික අධිකරණය
(3) ආර්ථික හා සමාජ මණ්ඩලය
(4) ආරක්ෂක මණ්ඩලය

12. ILO නමින් හඳුන්වන්නේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අනුබද්ධ ආයතනයකි. එය කුමක් ද?
(1) ආහාර හා කෘෂිකර්ම සංවිධානය (2) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල
(3) ලෝක සෞඛ්‍ය සංවිධානය (4) ජාත්‍යන්තර කම්කරු සංවිධානය

13. ශ්‍රී ලංකාවේ පළමු නාගරීකරණයට අයත්වන නගර දෙක හැඳින්වීමට යෙදූ අක්ෂර දෙක සඳහන් වරණය තෝරන්න.
A අනුරාධපුරය B කළුතර C මහනුවර D මාගම
(1) A හා B ය. (2) B හා C ය. (3) A හා D ය. (4) B හා C ය.

14. පහත සඳහන් කාර්යන් අතරින් කෝට්ටේ රාජ්‍ය සමයට අයත් සිදුවීම් ඇතුළත් පිළිතුර තෝරන්න.
A චන්ද්‍රභානුගේ ආක්‍රමණය සිදුවීම.
B සපුමල් කුමරු යවා යාපනය ජයගැනීම.
C කාලිංගරායර් හා චෝඩගංගදේවගේ ආක්‍රමණය.
D උඩරට සාමන්ත පාලක ජෝතිය සිටාණන්ගේ කැරැල්ල මැඩ පැවැත්වීම.
(1) A හා B ය. (2) A හා C ය. (3) B හා D ය. (4) B හා C ය.

15. පහත සඳහන් සිදුවීම් අතරින් උඩරට රාජධානියට අයත් සිදුවීමක් නොවන්නේ මින් කුමක් ද?
(1) සිංහල සංගය ඇතිවීම.
(2) නව රාජ වංශයක ආරම්භය.
(3) දෙල්ගමු විහාරයේ තිබූ දළදාව මහනුවරට වැඩම කරවීම.
(4) කොත්මලේ හා වලපනේ යකඩ හා වානේ කර්මාන්තය දියුණු කිරීම.

16. පහත බදු වර්ග අධ්‍යයනය කර රෙදි විවීම හා ඇතුන් ඇල්ලීම සම්බන්ධව සඳහන් වන බදු වර්ග තෝරන්න.
A මඩිහේ බද්ද B රදා බද්ද C හැඳ බද්ද D කුරුවේ බද්ද
(1) C හා D ය. (2) A හා B ය. (3) B හා D ය. (4) B හා C ය.


- පහත වගුවේ A සිට L දක්වා තොරතුරු ඇසුරින් 17, 18 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| අදාළ රට | විද්‍යාඥයාගේ නම | සොයා ගැනීම |
|---|---|---|
| A පෝලන්තය | E ජොහැන්නස් කෙප්ලර් | I දුරදක්නය නිපදවීම |
| B එංගලන්තය | F ගැලීලියෝ ගැලීලි | J පෘථිවිය ගෝලාකාර බව |
| C ජර්මනිය | G අයිසෙක් නිව්ටන් | K ග්‍රහලෝක සියල්ලම සූර්යයා වටා ඉලිප්සාකාරව ගමන් කරන බව |
| D ඉතාලිය | H නිකලස් කොපර්නිකස් | L ගුරුත්වාකර්ෂණය |

17. ඉහත වගුව අධ්‍යයනය කර ගුරුත්වාකර්ෂණ නියමයට අදාළ පිළිතුර තෝරන්න.
(1) BGL (2) BEI (3) CGL (4) BGJ

18. නූතන තාරකා විද්‍යාවේ පියා හා අත්හදා බැලීම් විද්‍යාවේ පියා යන අන්වර්ථ නාමයන්ගෙන් හැඳින් වූ විද්‍යාඥයින් දෙදෙනා දක්වෙන අක්ෂර ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) E හා G (2) H හා F (3) G හා H (4) E හා F

19. උඩරට රාජධානියට වෙරළබඩ තීරයක් අහිමි කරමින් උඩරට සාම්ප්‍රදායික වෙළඳාමට බාධා කරමින් 1766 ගිවිසුම අත්සන් කළේ කුමන කණ්ඩායම් දෙක අතරද,
(1) ලන්දේසි හා ශ්‍රී විජය රාජසිංහ
(2) පෘතුගීසීන් හා දෙවන රාජසිංහ
(3) ලන්දේසීන් හා කීර්ති ශ්‍රී රාජසිංහ
(4) ඉංග්‍රීසි හා ශ්‍රී වික්‍රම රාජසිංහ




20. ශ්‍රී ලංකාවේ ලන්දේසි බලකොටු 02 ක් වන අරිප්පු හා අඟුරුවාතොට බලකොටු ස්ථානගත වී තිබූ ආකාරය පෙන්වන අක්ෂර දෙක සඳහන් පිළිතුර තෝරන්න.
(1) A හා D (2) A හා B
(3) A හා C (4) D හා C

21.  පහත පින්තූරයෙන් දක්වෙන්නේ දුම්රිය ප්‍රවාහන ක්ෂේත්‍රය ආශ්‍රිත වැදගත් නිර්මාණයක් කළ පුද්ගලයෙකි. ඔහු කවුදැයි පහත පිළිතුරු අතරින් තෝරන්න.

(1) ඩෙම්ලර්
(2) ජෝර්ජ් ස්ටීවන්සන්
(3) ජෝන් මැකඩම්
(4) ජේම්ස් වොට්

- **පහත සඳහන් නිපයුම් අධ්‍යයනය කර 22 වන ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.**

A රෝලර් යන්ත්‍රය  B ආරක්ෂිත ලාම්පුව
C විවෘත උදුන් ක්‍රමය  D නිව් කොමන්ගේ වාෂ්ප එන්ජිම

22. යකඩ හා වානේ කර්මාන්තයේ නිපදවීම් වලට අදාළ පිළිතුර පහත පිළිතුරු අතුරින් තෝරන්න.
(1) C හා D  (2) B හා C  (3) A හා C  (4) A හා D

23. ක්‍රි.ව. 1623 වර්ෂයේ දී ලන්දේසීන් විසින් පහර දුන් කුළුබඩු වලින් සපිරි දූපත කුමක් ද?
(1) කේප්වර්ඩ් දූපත  (2) ජාවා දූපත
(3) ඇම්බොයිනා දූපත  (4) පිලිපීන් දූපත

24. කන්නසාමි කුමාරයාට ශ්‍රී වික්‍රම රාජසිංහ නමින් රජවීමට උදව් කළ ප්‍රභූවරයා කවුද?
(1) පිළිමතලව්වේ අදිකාරම්  (2) ඇහැලේපොල අදිකාරම්
(3) කැප්පෙටිපොළ දිසාවේ  (4) ගලගෙදර මොහොට්ටාල

25. 1804 1818 කාලයේ ලංකාවේ මිෂනාරී සංගම් කීපයක් ක්‍රියාත්මක විය. පහත වගුව උපයෝගී කරගෙන බැප්ටිස්ට් මිෂනාරී සංගමය ක්‍රියාත්මක වූ ආකාරයට අදාළ පිළිතුර තෝරන්න.

| මිෂනාරි සංගමය | ලංකාවට පැමිණි වසර | ලංකාවේ ක්‍රියාත්මක ප්‍රදේශය |
|---|---|---|
| A බැප්ටිස්ට් මිෂනාරි සංගමය | D 1814 1815 | G කොළඹ |
| B වෙස්ලියන් මිෂනාරි සංගමය | E 1816 | H උතුරු පළාත |
| C ඇමෙරිකන් මිෂනාරි සංගමය | F 1812 | I යාපනය හා උතුරු ප්‍රදේශය |

(1) A E G  (2) A D H  (3) B E I  (4) C F H

26. බෞද්ධ පූජනීය ස්ථාන රක ගැනීමේ ව්‍යාපාරයේ දී දේශීය ජනතාව දැනුවත් කළ යුරෝපීය උගතුන් අඩංගු පිළිතුර තෝරන්න.

A - ජෝර්ජ් ටර්නර් මහතා  B - අනගාරික ධර්මපාල තුමා
C - හෙන්රි ඕකල්ට්තුමා  D - හෙන්රි පාකර් මහතා

(1) B හා C  (2) C හා D  (3) A හා D  (4) A හා B

- **පහත සඳහන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා යෝජනා අධ්‍යයනය කොට 27, 28 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

A විධායක කාරක සභා ක්‍රමය ඇති කිරීම.
B සීමිත ඡන්ද බලය ලබාදීම.
C රාජ්‍ය මන්ත්‍රණ සභාව පිහිටුවීම.
D ව්‍යවස්ථාදායක විධායක සභා පිහිටුවීම.
E උගත් ලාංකිකයකු පත් කිරීම.

27. 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අදාළ යෝජනා ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) B හා D  (2) A හා C  (3) B හා C  (4) C හා D

28. ඉහත යෝජනා වලින් කෲව් මැකලම් ආණ්ඩුක්‍රමයට අදාළ යෝජනා ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) A හා C  (2) B හා C  (3) D හා E  (4) B හා E



29. නිදහස දිනාගැනීම සඳහා සූරියමල් ව්‍යාපාරය ඔස්සේ උද්ඝෝෂණය කළ වාමාංශික නායකයෙකු පින්තූරයෙන් දක්වේ. එම පුද්ගලයා කවුරුන්දැයි සඳහන් කරන්න.
(1) ආචාර්ය කොල්වින් ආර්ද සිල්වා  (2) ඩී.බී. ජයතිලක
(3) ආචාර්ය ඇන්.ඇම්. පෙරේරා  (4) ජේම්ස් පීරිස් මහතා

30. පහත සඳහන් ප්‍රකාශ අධ්‍යයනය කර බ්‍රිතාන්‍ය පාලනයේ අයහපත් බලපෑම් ඇතුළත් ප්‍රකාශ ඇතුළත් පිළිතුර තෝරන්න.

A ජාත්‍යන්තර භාෂාවක් වූ ඉංග්‍රීසි භාෂා දැනුම ලැබීම.

B ඉඩම් අහිමි ජනතාවක් බිහිවීම.

C කාර්මික විප්ලවයේ බලපෑම ලැබීම.

D බටහිර සංස්කෘතියේ අංග රටපුරා පැතිර වීම.

(1) C හා D (2) A හා B (3) B හා D (4) B හා C

31. පහත සඳහන් නායකයන් අතරින් නාගරික කම්කරුවන් හා වතු කම්කරුවන් නියෝජනය කරන වෘත්තිය සංගම් වල නායකත්වය දැරූ නායකයන් ඇතුළත් පිළිතුර තෝරන්න.

A ඒ.ඊ. ගුණසිංහ

B වලිසිංහ හරිශ්චන්ද්‍ර

C ආතර් වීදියෙස්

D නටේසර් අයියර්

(1) A හා B (2) B හා C (3) A හා D (4) C හා D

- **අංක 32, 33, 34 ප්‍රශ්නවලට හිස්තැනට වඩාත් සුදුසු පිළිතුර දී ඇති පිළිතුර අතරින් තෝරන්න.**

32. සොල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියා වූයේ ......................... වරයාය.
(1) ජනාධිපති තුමා (2) කථානායකතුමා (3) අග්‍රාණ්ඩුකාරවරයා (4) අගමැතිවරයා

33. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව පාර්ලිමේන්තුව හැඳින්වූයේ ......................... යන නමිනි.
(1) ජාතික රාජ්‍ය සභාව (2) ව්‍යවස්ථාදායකය (3) රාජ්‍ය මන්ත්‍රණ සභාව (4) විධායකය

34. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ජනතාව සතු විධායක බලය ජනතාව විසින් පත්කරගත් ......................... විසින් ක්‍රියාත්මක කරනු ලැබේ.
(1) අගමැති (2) අගවිනිසුරු (3) කථානායක (4) ජනාධිපති

- **පහත සඳහන් A, B ප්‍රකාශ කියවා 35, 36 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

A මුද්දර පනත B ගැබෙල් බද්ද

35. මෙම ප්‍රකාශ අතරින් ඇමෙරිකානු නිදහස් සටන සම්බන්ධයෙන් සත්‍ය වන පිළිතුර තෝරන්න.
(1) A සත්‍ය වන අතර B අසත්‍ය වේ. (2) A අසත්‍ය වන අතර B සත්‍ය වේ.
(3) A හා B සත්‍ය වේ. (4) A හා B අසත්‍ය වේ.

36. ප්‍රංශ විප්ලවය සම්බන්ධයෙන් සත්‍ය වන පිළිතුර තෝරන්න.
(1) A සත්‍ය වන අතර B අසත්‍ය වේ. (2) A අසත්‍ය වන අතර B සත්‍ය වේ.
(3) A හා B සත්‍ය වේ. (4) A හා B අසත්‍ය වේ.


37. ''මේ අවස්ථාවේ අපි බලය අල්ලා නොගතහොත් ඉතිහාසය අපට සමාව නොදෙනු ඇත.'' 1917 ඔක්තෝම්බර් විප්ලවයට අදාලව මෙම ප්‍රකාශය කළ තැනැත්තා කවුද?
(1) ලියෝ ට්‍රොට්ස්කි (2) වී.අයි. ලෙනින් (3) කෙරෙන්ස්කි (4) නැපෝලියන් බොනපාට්

38. A හා B ප්‍රකාශ කියවා පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A ප්‍රංශය යුරෝපයේ තනි කිරීමට අනුගමනය කළ ප්‍රතිපත්තිය. B ජපානයේ ක්‍රියාකාරීත්වය.

ඉහත ප්‍රකාශ වලින් පළමු ලෝක යුද්ධය සම්බන්ධ සත්‍ය ප්‍රකාශය කුමක් ද?
(1) A සත්‍ය වන අතර B අසත්‍ය වේ. (2) A අසත්‍ය වන අතර B සත්‍ය වේ.
(3) A හා B සත්‍ය වේ. (4) A හා B අසත්‍ය වේ.

39. කඩිනම් මහවැලි සංවර්ධන ව්‍යාපාරය යටතේ සිදුකෙරෙන ජල සම්පාදන ව්‍යාපෘති ආශ්‍රිත සිතියමක් මෙහි දැක්වේ. එහි දැක්වෙන ප්‍රධාන මහවැලි නිම්නයෙන් ජලය සැපයෙන A වලින් දැක්වෙන වැව හා B වලින් දැක්වෙන ඇළ මාර්ගය අඩංගු පිළිතුර කුමක් ද?
(1) රන්දෙනිගල ජලාශය හා මින්නේරිය වැව.
(2) බෝවතැන්න ජලාශය හා ඇළහැර ඇළ.
(3) පරාක්‍රම සමුද්‍රය හා මිණිපේ ඇළ.
(4) රන්ටැඹේ ජලාශය හා මිණිපේ ඇළ.




40. දෙවන ලෝක සංග්‍රාමය අවසන් සමයේදී 1945 මැයි මාසයේ දී ජර්මනිය කොන්දේසි විරහිතව මිත්‍ර සේනාවන්ට යටත් වූයේ මින් කවර හේතුවක් නිසාද?
(1) තම නායකයා අහිමි වීමෙන් ජර්මන් සේනාව මෙහෙයවීම අඩාල වීම.
(2) හිට්ලර් තම හමුදාව ඉදිරියට මෙහෙයවීමට අණදීම.
(3) ජර්මන් හමුදාව දිග ශීත සෘතුවකට මුහුණ දීමට සූදානම්ව නොසිටීම.
(4) ජපානය විසින් ජර්මනිය ආක්‍රමණය කිරීම.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# අවසාන වාර පරීක්ෂණය 2016

**11 ශ්‍රේණිය**

# ඉතිහාසය - II

**කාලය පැය 03 යි.**

නම/ විභාග අංකයඃ

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- දෙවන කොටසින් ප්‍රශ්න හතරක් ද තෙවන කොටසින් ප්‍රශ්න එකකට ද පිළිතුරු සැපයිය යුතුය.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

## පළමුවන කොටස

(01) (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ලෝක සිතියමෙහි ද ලකුණු කර නම් කරන්න.

(i) කලාඔය, දේවනගර, කඳුරුගොඩ, පදවිය, මහනුවර, පොළොන්නරුව, හුරුලු වැව, සේරුවිල, කොළඹ, ලුණුවිල, උතිනගර, මඩකලපුව (ල. 10)

(ii) ඉතාලිය, ඇලෙක්සැන්ඩ්‍රියා, බ්‍රිතාන්‍යය, කල්කටා, රතු මුහුද, දකුණු කොරියාව (ල. 08)

(ආ) පහත A B C හා D යටතේ දක්වා ඇති තොරතුරු හා සම්බන්ධ පිළිතුරු අනුපිළිවෙලින් පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

(i) A ශ්‍රී ලංකාවේ ආරම්භ කළ පළමුවන බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රමය කුමක් ද?

B වීරාංකුර නමින් හැඳින්වූ පන්සලක වාසයකළ භික්ෂූන් වහන්සේලාට රන් කලං 200 ක් පූජාකළ රජතුමා.

C පන්සිය පනස් ජාතක පොත සිංහලට පරිවර්තනය කිරීම සිදුවූයේ කුමන රාජධානි සමයේ ද?

D ප්‍රංශ විප්ලව සමයේ ප්‍රංශය පාලනය කරන ලද රාජ වංශය (ල. 04)

- A හා B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසාඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක අනුපිළිවෙළින් ලියන්න.



A

(ii) 1. A පින්තූරයේ දැක්වෙන පුද්ගලයා හඳුනාගෙන නම් කරන්න.

2. මෙතුමා විසින් මෙහෙයවන ලද සටන කුමක් ද?

3. මෙතුමාගේ මෙහෙයවීම මත සටන්කාමීන් විසින් උඩරට රජුලෙස ප්‍රකාශයට පත්කළේ කවුරුන් ද?

4. මෙතුමා මෙහෙයවූ සටන මර්දනය කිරීමට ඉංග්‍රීසීන් අනුගමනය කළ ප්‍රතිපත්තිය කුමක් ද? (ල.04)

(iii) 1. B පින්තූරයේ දැක්වෙන ගොඩනැගිල්ල පිහිටි රට කුමක් ද?

2. 1794 වර්ෂයේ දී ප්‍රංශය විසින් ඕලන්දය ආක්‍රමණය කරනවිට ඕලන්දයේ සිටි පාලකයා කවුද?

3. එම ඕලන්ද පාලකයා මෙම ගොඩනැගිල්ලේ සිට ලංකාවේ සිටි ෆන් එංගල්බෙග් වෙත එව් ලිපිය කුමක් ද?

4. 1795 වර්ෂයේ දී ඉංග්‍රීසීන් විසින් ලන්දේසීන් සතුවූ ශ්‍රී ලංකාවේ කුමන වරායට පහර දුන්නේ ද? (ල. 04)



B

## දෙවන කොටස

02 (i) පැරණි කාසි ඉතා වැදගත් මූලාශ්‍රයක් කොට ගෙන හදාරන ක්ෂේත්‍ර 03 ක් දක්වන්න. (ල. 03)

(ii) පහත A, B, C හා D වලින් දැක්වෙන එක් එක් කරුණට අදාලව මූලාශ්‍ර වර්ගය අනුපිළිවෙලින් දක්වන්න.

A පාහියන් හිමිගේ දේශාටන වාර්තාව.

B ප්ලිනිගේ නැචුරලිස් හිස්ටෝරියා කෘතිය.

C බැල්ඩියස්ගේ ලංකා පුරාවෘත්තය.

D මෙගස්තීනිස්ගේ ඉන්ඩිගා කෘතිය. (ල. 04)

(iii) ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයාගේ ආහාර රටාව සකස් වී තිබූ ආකාරය, සත්ව ආහාර, ශාක ආහාර, උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ල. 05)

(iv) ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යුහය සකස් වී තිබූ ආකාර 03 ක් දක්වා උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ල. 06)

03 (i) පහත A, B, C යටතේ දක්වා ඇති රාජ්‍ය නිලධාරීන් හැඳින්වීමට භාවිතා කළ පැරණි නම් අනුපිළිවෙලින් දක්වන්න. (ල. 03)

A නගර පරිපාලක

B රාජ්‍ය ලේඛණාගාර ප්‍රධානි

C ඇත් අංශයේ ප්‍රධානි

(ii) පහත සඳහන් තොරතුරු ඇතුලත් අභිලේඛන, අංක අනුපිළිවෙලින් දක්වන්න.

(1) බෞද්ධ භික්ෂූන් වහන්සේලා වෙත කොත්ගල්කන්දේ ගල්ගුහාවක් පූජාකළ පරුමකයෙකු ගැන සඳහන් වන අභිලේඛණය.

(2) බුදල්නා විසින් රාජකීය පවුලට දෙන ලද රූකවරණයේ ස්වභාවය පිළිබඳ විස්තර ඇතුලත් අභිලේඛණය.

(3) දෙවන සේන රජතුමාගේ අණින් පිරිනමන ලද ඉඩම් පූජාකර එහි නීතිමය කටයුතු කිරීමට කාශ්‍යප නැමැති මහලේකම් වරයා පැමිණිබව සඳහන් අභිලේඛණය.

(4) නාගදීපය පාලනය කළ සෘෂිගිරි ඇමති පියංගුකතිස්ස නම් විහාරය ඉදිකළ බව සඳහන් අභිලේඛණය. (ල. 04)

(iii) ශ්‍රී ලංකාවේ පැරණි සමාජයේ වාසය කළ බොහෝ ගැමියන්ගේ ප්‍රධාන ජීවන වෘත්තිය වූයේ ගොවිතැනය.

A හේන් ගොවිතැන සඳහා හේන සකස් කිරීම.

B හේන්වල බෝග වගාව.

උදාහරණ සහිතව විස්තර කරන්න. (ල. 05)

(iv) පැරණි සමාජය තුළ වර්ගික සහජීවනය ඇතිකර ගැනීමට ගත් ක්‍රියාමාර්ග 03 ක් දක්වා නිදසුන් සහිතව විස්තර කරන්න. (ල. 06)

04 (i) A ඓතිහාසික යුගයේ රජුට සමීපව කටයුතු කළ නිලධාරීන් හැඳින්වූයේ කුමන නමින් ද?

B සාමාන්‍ය ජනතාව හැඳින්වූයේ කුමන නමින් ද?

C පාරම්පරිකව දාසයන්ලෙස ගතකළ අය හැඳින්වූයේ කුමන නමින් ද? (ල. 03)

(ii) පහත දැක්වෙන නීති පැනවූ රජවරු, අනුපිළිවෙලින් දක්වන්න.

(1) හෝපිටිගම වෙළඳපලේ සිදුවූ අකටයුතුකම් වලක්වාලීමට ගත් එක් නීතියක. පොහොය දිනවල වෙළඳාම් කළ අයගෙන් දඩයක් වශයෙන් තෙල් බද්දක් ලබාගැනීම.

(2) කිසිදු සතෙකු නොමැරිය යුතු බවට මුල් වරට නීතියක් පැනවීම (මාඝාතනීතිය)

(3) ජලාශවල ජීවත්වන පක්ෂීන් නොමැරිය යුතු බව.

(4) ''ගෘහදණ්ඩ'' නිතිය පැනවීම. (ල. 04)

(iii) පළමු නාගරීකරණයට අදාල පැරණි නගර පරිහානියට බලපෑ හේතු දෙකක් දක්වා උදාහරණ සහිතව කෙටියෙන් විස්තර කරන්න. (ල. 05)

(iv) දඹදෙණි රාජධානියේ සිටි ශ්‍රේෂ්ඨ පාලකයෙකු වූ දෙවැනි පරාක්‍රමබාහු රජතුමාට මුහුණදීමට සිදුවූ විදේශ ආක්‍රමණ තුනක් දක්වා එම ආක්‍රමණ විශිෂ්ඨ ලෙස ජයගැනීමට එතුමාගත් උත්සාහය අගය කරන්න. (ල. 06)

05 (i) A උඩරට රාජධානියේ ආරම්භකයා කව්ද?

B උඩරට නව රාජවංශයක ආරම්භකයා කව්ද?

C උඩරට නායක්කර් වංශික ආරම්භක පාලකයා කව්ද? (ල. 03)




(ii) යාබඳ පින්තූරයේ දැක්වෙන රජතුමාට සිය පාලන සමයේදී මුහුණ දීමට සිදුවූ අභියෝග 04 ක් දක්වන්න. (ල. 04)

(iii) කීර්ති ශ්‍රී රාජසිංහ රජු විසින් රට පුරා බෞද්ධ ප්‍රබෝධයක් ඇතිකිරීමට ගත් ක්‍රියාමාර්ග 02 ක් දක්වා කෙටියෙන් විස්තර කරන්න. (ල. 05)

(iv) මහනුවර රාජධානියේ සමාජ සංවිධානය සකස් වී තිබූ ආකාරය පිළිබඳව සාධක තුනක් දක්වා උදාහරණ සහිතව විග්‍රහ කරන්න. (ල. 06)

06 (i) සිතියමේ A, B, C වලින් දැක්වෙන ලන්දේසි බලකොටු තුන අනුපිළිවෙලින් නම් කරන්න. (ල. 03)




(ii) පහත 1, 2, 3, 4 සටන් වලට නායකත්වය දුන් පෘතුගීසි නායකයින් අනුපිළිවෙලින් දක්වන්න.

(1) දන්තුරේ සටන

(2) බලන සටන

(3) රන්දෙනිවල සටන

(4) ගන්නෝරුව සටන (ල. 04)

(iii) පෘතුගීසීන්ට යාපනය රාජධානිය පහසුවෙන්ම අල්ලා ගැනීමට බලපෑ හේතු දෙකක් දක්වා විස්තර කරන්න. (ල.05)

(iv) උඩරට රාජ්‍ය සම්බන්ධයෙන් ලන්දේසීන්ගේ ප්‍රතිපත්තියේ කැපී පෙනුණු ලක්ෂණ 03 ක් දක්වා විස්තර කරන්න. (ල.06)

## තුන්වන කොටස

07 (i) ශ්‍රී ලංකාව තුළ සමාජවාදී සමාජයක් නිර්මාණය කිරීමේ අරමුණින් 1935 වසරේ ලංකා සමසමාජ පක්ෂය පිහිටුවා ගැනීමට මුල් වූ නායකයන් තිදෙනා නම් කරන්න. (ල. 03)

(ii) පහත A, B, C, D ප්‍රකාශ වලට අදාළ වන ප්‍රතිසංස්කරණ හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා A, B, C, D පිළිවෙලින් නම් කරන්න.

A සිංහල භාෂාව රාජ්‍ය භාෂාව බවට පත්කිරීම.

B බ්‍රිතාන්‍ය රාජ්‍යය සමග පැවති ව්‍යවස්ථානුකූල බැඳීම් අවසන් කිරීම.

C ජනාධිපති ධූරය, පූර්ණ විධායක බලතල සහිත රජයේ ඉහළම විධායක තනතුර බවට පත්වීම.

D සමානුපාතික නියෝජන ක්‍රමය හඳුන්වා දීම. (ල. 04)

(iii) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිළිගෙන ඇති මූලික අයිතීන් 02 ක් නම් කර 1972 ට වඩා 1978 ව්‍යවස්ථාව අයිතිවාසිකම් අතින් ඉදිරියට ගොස් ඇති ආකාරය පැහැදිලි කරන්න. (ල. 05)

(iv) ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතිය අනුව දිවයිනේ උත්තරීතර හා අවසාන අධිකරණ බලය හිමි උසාවිය ශ්‍රේෂ්ඨාධිකරණයයි. ශ්‍රේෂ්ඨාධිකරණයට අයත් කාර්යයන් 02 ක් නම් කර එකක් විස්තර කරන්න. (ල. 06)

08 (i) පහත දැක්වෙන ප්‍රකාශවලට අදාල ලෝකයේ කැපී පෙනෙන විප්ලව දක්වන්න.

A නියෝජිතයන් නැතිනම් බදුත් නැත.

B නිදහස, සමානාත්මතාවය හා සහෝදරත්වය

C සාමය, ඉඩම් හා ආහාර (ල. 03)

(ii) ප්‍රංශ විප්ලවයට දාර්ශනික මතවාද සහිත කෘති 02 ක් පහත දැක්වේ. එම කෘති රචනා කළ දාර්ශනිකයන් දෙදෙනා නම් කර එම කෘති වලින් කියවෙන දර්ශනයන් සඳහන් කරන්න.

| කෘතියේ නම | කතුවරයා | අඩංගු තොරතුරු |
|---|---|---|
| • නීතියේ සාරය | ..................... | ..................... |
| • සමාජ සම්මුතිය | ..................... | ..................... |

(ල. 04)

(iii) ලෝකයේ කාර්මික විප්ලවයේ ව්‍යාප්තියත් සමඟ ප්‍රවාහන ක්ෂේත්‍රයේ හා සන්නිවේදන ක්ෂේත්‍රයේ ඇති වූ දියුණුව උදාහරණ දෙමින් විස්තර කරන්න. (ල. 05)

(iv) 19 වන සියවසේ දී ලොව විවිධ රටවලට කාර්මීකරණය ව්‍යාප්ත වීමට බලපෑ හේතු දක්වමින් කාර්මික විප්ලවයේ ප්‍රතිඵල 03 ක් විස්තර කරන්න. (ල. 06)

09 (i) පුනරුද සමයේ වෛද්‍ය විද්‍යාවේ දියුණුව ඇති කිරීමට දායක වූ විද්‍යාඥයින් තිදෙනෙකු නම් කරන්න. (ල. 03)

(ii) A පුනරුද සමයේ කලාත්මක ක්ෂේත්‍රයේ ඇති වූ වැදගත් වෙනස් කම් දෙකක් සඳහන් කරන්න. (ල.02)

B විද්‍යාත්මක ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්කම් දෙකක් සඳහන් කරන්න. (ල.02)

(iii) පුනරුද සමයේ නව මුහුදු මාර්ග සොයා යාමේ ගමන සාර්ථක කර ගැනීමට යුරෝපයේ පරිසරය ගොඩනැගුන ආකාරය කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ල. 05)

(iv) පුනරුදයේ ගෝලීය ප්‍රවනතාව ශ්‍රී ලංකාවට බලපෑ ආකාරය,

A දේශපාලන

B ආර්ථික

C සමාජ සංස්කෘතික

අංශයන් යටතේ උදාහරණ එක බැගින් දක්වමින් පැහැදිලි කරන්න. (ල. 06)

10 (i) 20 වන සියවසේ සමස්ත ලෝකයම කම්පා කළ ලෝක සංග්‍රාම දෙකක් ඇති විය. එයින් පළමු ලෝක සංග්‍රාමයට සම්බන්ධ වූ මිත්‍ර පිලේ රටවල් 03 ක් නම් කරන්න. (ල. 03)

(ii) පහත A, B, C, D යටතේ දක්වා ඇති සිද්ධි හා සම්බන්ධ පුද්ගලයන් නම් කරන්න.

A ජර්මන් භාෂාව කථා කළ වැසියන් සිටි කුඩා රාජ්‍ය එකතු කර එක්සත් ජර්මනිය ගොඩනැගීම.

B ජර්මනියට යටත් විජිත පිහිටුවා ජර්මන් අධිරාජ්‍යක් ගොඩගැනීම.

C අවි ආයුධ බලයෙන් වසර පහකදී ලබාගත් දේ ආරක්ෂා කිරීමට තව වසර 50 ක් සන්නද්ධව සිටීමට අවශ්‍ය බව ප්‍රකාශ කළ පුද්ගලයා.

D බොස්නියාවේ සරයේවෝ නගරයේ දී සර්බියානුවන් අතින් ඝාතනය වූ කුමරු. (ල. 04)

(iii) 1939 සැප්තැම්බර් සිට 1945 අගෝස්තු දක්වා වසර හයක කාලයක් ලොව පුරා පැවති බිහිසුණු සංග්‍රාමය දෙවන ලෝක යුද්ධයයි. මෙම යුද්ධයට බලපෑ හේතු 02 ක් නම් කර පැහැදිලි කරන්න. (ල. 05)

(iv) නිරවි යුධ සමයේදී එක්සත් ජාතීන්ගේ සංවිධානය මැදිහත් වී ගැටුම් ඇති වීමට ගිය අවස්ථා කීපයක් වලක්වා ගන්නා ලදී. එසේ වලක්වා ගත් අර්බුද 02 ක් නම් කර විස්තර කරන්න. (ල. 06)

The National e-learning Portal - The Gateway to Education

(01) (අ) (i) ප්‍රශ්නයට අදාළ ශ්‍රී ලංකා සිතියම



(01) (අ) (ii) ප්‍රශ්නයට අදාළ ලෝක සිතියම



## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(3) | 2 -(4) | 3 -(3) | 4 -(1) | 5 -(2) | 6 -(2) | 7 -(1) | 8 -(2) | 9 -(2) | 10 -(3) |
| 11-(2) | 12-(4) | 13-(3) | 14-(3) | 15-(1) | 16-(1) | 17-(1) | 18-(2) | 19-(3) | 20-(2) |
| 21-(2) | 22-(3) | 23-(3) | 24-(1) | 25-(1) | 26-(3) | 27-(2) | 28-(4) | 29-(3) | 30-(3) |
| 31-(3) | 32-(4) | 33-(1) | 34-(4) | 35-(1) | 36-(2) | 37-(2) | 38-(1) | 39-(3) | 40-(1) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II කොටස

(01) (අ) i. , ii ලංකා හා ලෝක සිතියම් පිළිතුරු දක්වා ඇත. (ලකුණු 13 + 5 = 18) (ආ) i. A. ගල්ඔය සංවර්ධන යෝජනා ක්‍රමය B. හතරවන කාශ්‍යප රජතුමා C. කුරුණෑගල සමයේ D. බූර්බෝන් රාජවංශය (ල.04) ii. (1) කැප්පෙටිපොල දිසාවේ (2) 1818 නිදහස් සටන (3) දොරේසාමි (4) බිම්පාළු ප්‍රතිපත්තිය (ල.04) iii. (1) එංගලන්තය (2) පස්වන විලියම් රජු (3) කිව්ලිපිය (4) ත්‍රිකුණාමලය (ල.04)

(02) (i) ● රටේ ආර්ථික තත්වය ● වෙළෙඳාම ● ලෝහ භාවිතය ● තාක්ෂණය (ආදී පිළිතුරු 03 ක් සඳහා) (ල.03) (ii) A. චීන මූලාශ්‍රය B. රෝම මූලාශ්‍රය C. ඕලන්ද මූලාශ්‍රය D. ග්‍රීක මූලාශ්‍රය (ල.04) (iii) <u>සත්ව ආහාර</u> ● දඩයම් කළ සතුන්ගෙන් ආහාර ලබාගැනීම. (ගව, කුළු මී හරකා, කළු වළහා, වල්ඌරා, ඉත්තෑවා, ගෝනා, තිත්මුවා, මී මින්නා, හාවා, දඬුලේනා, හම්බාවා, මුගටියා, උරුලෑවා, වඳුරා, වළිකුකුලා, හබන් කුකුළා, පිඹුරා, තලගොයා) ● මිරිදිය මාළු වර්ග අල්ලා ආහාරයට ගැනීම. ● ගොළු බෙල්ලන් අල්ලා ආහාරයට ගැනීම, කලපු බෙල්ලන් ආහාරයට ගැනීම. <u>ශාක ආහාර</u> ● කැළෑවෙන් සොයාගන්නා ලද ශාක ආහාර. ● වල් දෙල්, කැලෑ කෙසෙල්, ගෝනල, කටුඅල, කිතුල් ඇට, දෝතලු ඇට ● ආහාර පුළුස්සා අනුභව කිරීම. (ශාක / සත්ව ආහාර ලබාගන්නා ක්‍රම වලට ල. 02, උදාහරණ විස්තරයට ල.03) (ල.05) (iv) ● වාපිගාම ● වෘත්තිකයන් විසුගාම ● කාර්යයන් පදනම් කොට ගෙන හැඳුනුගාම (ල.03) / ● වාපිගාම : වැවක් කේන්ද්‍රකොට ගෙන වර්ධනය වූ ජනාවාස වාපීගාම යනුවෙන් හැඳින්වේ. උදාහරණ : සුමනවාපිගාම, විහාරවාපිගාම, හුන්දරීවාපිගාම, කඩහවාපිගාම. මෙම ගාම කෘෂිකර්මාන්තය පදනම් කොටගෙන සැදුනුගාමයි. ● වෘත්තිකයන් විසුගාම : විවිධ වෘත්තීන්ට අනුව එම වෘත්තියේ ස්වභාවය අනුව මෙම ගාම සෑදී ඇත. කසීකාරගාම, මණිකාරගාම, ගෝපාලගාම, කේවට්ටගාම, කුට්භකාරගාම, වඩ්ඩකීගාම උදාහරණ සහිතව පැහැදිලි කළ යුතුයි. ● කාර්යයන් පදනම් කරගත්ගාම : යම් ස්ථානයක කෙරෙන කාර්යයන් අනුවද ගම් නිර්මානය වී ඇත. පට්ඨානගාම, නියම්ගම් (උදාහරණ සහිතව විස්තර කළයුතුයි.) (ල.03) (iv කොටසට මුළු ලකුණු 6 යි.)

(03) i. A. නගර ගුතික B. කනපෙඩික C. හතිඅදෙක (ල.03) ii. (1) කණ්ඩලම සෙල්ලිපිය (2) පනාකඩුව තඹ සන්නස (3) මැදිරිගිරිය සෙල්ලිපිය (4) වල්ලිපුරම් රන්පත් ලේඛණය (ල.04) iii. A. ● හේනක් සෑදීමට භූමිය තෝරා ගැනීම. ● වල්කොටා ගිණිතබා සකස් කිරීම. ● ගිණි තැබීමට පෙර සතුන් එලවන ආකාරය. ● නවදැලිහේන, කනතුහේන විස්තර කිරීම. ● දඬුවැට දැමීම. B. ● හේන්වල වගාකරන භෝග වර්ග ලිවීම. ● වගාකරන ක්‍රමය ● පැල් රැකීම (ල.05) iv. ● එකිනෙකා සමඟ කලකෝලාහල කරගැනීමට උත්සාහ නොගැනීම. ● අන්‍ය ජාතීන් දෙස සැකමුසු ලෙස දකින්නට වැසියන් පුරුදු වී සිටියේ නැත. ● සුහද ලෙස ජීවත්වීමට කටයුතු කිරීම. ● ආරක්ෂාව හා සුභසාධනය පාලකයන්ගෙන් අන්‍ය ජනවර්ගවලට නොඅඩුව ලැබීම. ● අන්‍ය ජාතීන් හා අන්‍ය ආගම් ඉවසා දරා ගැනීමට මෙරට වැසියන් හුරුවී සිටීම. ● සියළු දෙනා සමගම සහජීවනයෙන් කටයුතු කිරීම. (ල.06)

(04) i. A. රද්කොල් සම්දරු B. කුඩීන් C. අන්වයාත දාස (ල.03) ii. (1) තුන්වන උදය රජතුමා (2) අමණ්ඩ ගාමිණී අභය රජතුමා (3) නිශ්ශංකමල්ල රජතුමා (4) හතරවන මිහිඳු රජු (ල.04) iii. ● සතුර ආක්‍රමණ ● මධ්‍යගත පාලනය බිඳ වැටීම. ● ආරක්ෂාව නැතිවීම. ● වෙළෙඳාම හා ගමනාගමන කටයුතු අඩපණ වීම. ● ජනතාව වෙනත් ප්‍රදේශවලට සංක්‍රමණය වීම. (මේවායින් 02 ක් දක්වා, උදාහරණ සහිතව විස්තර කිරීම ලකුණු 2 + 3 = 5) iv. ● ක්‍රි.ව. 1215 දී කාලිංග මාඝගේ ආක්‍රමණය (1255 දී රට මුදවාගැනීම සටන් කිරීමට සිදුවිය) ● ක්‍රි.ව. 1247 චන්ද්‍රභානු නම් ජාවක රජුගේ ආක්‍රමණය ● ක්‍රි.ව. 1261 දී නැවත චන්ද්‍රභානුගේ ආක්‍රමණය (කරුණු 03 ලකුණු 3 + විස්තර කිරීමට ලකුණු 03 = මුළු ලකුණු 06)

(05) i. A. සේනාසම්මත වික්‍රමබාහු රජු B. පළමුවන විමලධර්මසූරිය රජු C. ශ්‍රී විජය රාජසිංහ රජු (ල.03) ii. (1) පෘතුගීසීන්ගෙන් උඩරටට එල්ලවන ප්‍රහාර මැඩ පැවැත්වීම. (2) පෘතුගීසීන් මෙරටින් පලවා හැරීම. (3) උඩරට රදළ ප්‍රධානීන්ගෙන් එල්ල වූ තර්ජන අවම කර ගැනීම. (4) ලන්දේසි බලපෑමෙන් උඩරට නිදහස් කර ගැනීම. (ල.04) iii. ●

සියම් දේශයෙන් උපසම්පදාව ගෙන්වා සියම් නිකාය ආරම්භ කිරීම. ● උඩරට / පහතරට විහාරාම ප්‍රතිසංස්කරණය කිරීම. ● වැලිවිට සරණංකර හිමියන්ට සංඝරාජ තනතුරු පිරිනැමීම. (ල.05) iv. ● ග්‍රාමීය සමාජයක් පැවතීම. ● දීග, බින්න, එකගෙයි ගෑම යන විවාහ ක්‍රම පැවැතීම. ● ගම ස්වයංපෝෂිත විය. ● පවුල ප්‍රධාන සමාජ ඒකකය වීම. ● කුල ක්‍රමය මත සමාජ සම්බන්ධතා පැවතීම. ● කුල ක්‍රමය මත ආර්ථික කටයුතු සිදුවීම. (ඉතිරි කරුනු (10 ශ්‍රේණිය 115 පිටුව බලන්න.) (ල.06)

(06) i. A. කල්පිටිය B. මීගමුව C. කොඩ්ඩියාර් (ල.03) ii. (1) පේරො ලොපෙස් ද සූසා (2) දොන් ජෙරොනිමෝද අසවේදු (3) කොන්ස්තන්තීනුද සා (4) දි යෝගෝ ද මෙලෝ කුස්තෝ (ල.04) iii. ● යාපනය රාජ්‍ය උරුමකරුවන් අතර බල අරගල නිසා එහි ජනතාව බෙදී සිටීම. ● ප්‍රමානවත් නිත්‍ය හමුදාවක් යාපනය පාලකයින්ට නොසිටීම. ● උඩරට මෙන් ස්වාභාවික ආරක්ෂාවක් නොතිබීම. (ල.05) iv. (1) උඩරට සමඟ සාමකාමී ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම. (2) උඩරට රජුගේ හොඳ හිත දිනාගැනීමට රජුට තෑගි හෝග දීම. (3) රජුගේ ආගමික කටයුතුවලට සහායදීම. (4) උඩරට රජු වෙනත් විදේශීය ජාතියක් සමඟ වෙළඳ සබඳතා පැවැත්වීම අවහිර කිරීම. (5) උඩරට හා පහතරට අතර කඩවත් වසා දැමීම. (6) වී වගාවට අනුග්‍රහය දක්වීම. (7) කුරුඳු වගා කරවීම හා වගාව ආරක්ෂා කිරීම. (8) උක්, කෝපි, කපු ආදී වගා කිරීම (මින් කරුණු 03 ක් ලියා තිබීමට ල.06)

(07) i. ● ආචාර්ය ඇන්.ඇම්. පෙරේරා මහතා ● ආචාර්ය කොල්වින් ආර්ද සිල්වා මහතා ● පිලිප් ගුණවර්ධන මහතා (ල.03) ii. A. 1956 බලයට පත් මහජන එක්සත් පෙරමුණේ හඳුන්වාදුන් ප්‍රතිපත්ති B. 1972 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයේ මූලික ලක්ෂණයකි. C. 1978 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය. D. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නියෝජන ක්‍රමයකි. (ල.04) iii. (1) නීතිය ඉදිරියේ සමානාත්මයෙන් සැලකීමේ නිදහස (2) කතා කිරීමේ හා අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස (3) වධහිංසා වලින් මිදීමේ නිදහස (4) කැමති ආගමක් ඇදහීමේ නිදහස (5) කැමති වෘත්තියක් රැකියාවක් කිරීමේ නිදහස් (කැමති දෙකක් නම් කිරීමට ලකුණු 02) ● විස්තර කිරීම : 1972 ව්‍යවස්ථාවට වඩා 1978 ඉදිරියට ගිය අවස්ථාවක් වන්නේ මූලික අයිතිවාසිකම් කඩවූ හෝ කඩවීමට ආසන්න අවස්ථාවක මාස තුනක් ඇතුළත් ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් ගොනුකළ හැකි බව විස්තර වේ. (විස්තරයට ල.03) iv. (1) මූලික අයිතිවාසිකම් පිළිබඳ නඩු විසඳීම. (2) ජනාධිපතිට එරෙහිව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන දෝෂාභියෝග පරීක්ෂා කිරීම. (3) පාර්ලිමේන්තු වරප්‍රසාද කඩකිරීම පිළිබඳ චෝදනා විමසීම (4) ඡන්ද පෙත්සම් පිළිබඳ අධිකරණ කටයුතු (මෙයින් 02 ක් නම් කිරීමට ලකුණු 02) ● විස්තර කිරීමට ලකුණු 04 මූලික අයිතිවාසිකම් 1978 ව්‍යවස්ථාවේ විස්තරාත්මකව විග්‍රහ කර තිබීම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිළිගත් මූලික අයිතීන් අතර නීතිය ඉදිරියේ සමානත්මතාවයෙන් සැලකීම, අදහස් ප්‍රකාශ අදහස් කැමති ............... ආදී අයිතීන් පිළිබඳ විස්තර කරන්න. (ල.06)

(08) i. A. ඇමරිකානු නිදහස් සටන B. ප්‍රංශ විප්ලවය C. රුසියන් විප්ලවය (ල.03) ii. ● නීතියේ සාරය එක් පුද්ගලයකු වටා බලය ඒක රාශී වීම නුසුදුසු බවත් ඒ නිසා බලය ව්‍යවස්ථාදායක විධායක අධිකරණ යන අංශ තුනකට බෙදිය යුතු බවත් එමගින් ඒකාධිපති පාලනයක් ගොඩ නැගීම වැලකෙන බව ප්‍රකාශ කිරීම. ● සමාජ සම්මුතිය රූසෝ ජනතා ස්වාධිපත්‍ය පිළිබඳ සංකල්පය ඉදිරිපත් කිරීම. රජු මහජනතාවගේ ශුභ සිද්ධිය සැලසිය යුතු බවත් එසේ නොවන පාලකයන් පලවා හැරීමේ අයිතිය ජනතාව සතුවන බව. (ල.02) iii. ● ප්‍රවාහන ක්ෂේත්‍රය මැකඩම් ක්‍රමය මහාමාර්ග ඉදිකිරීමේ නව ක්‍රමයක්, දුම්රිය එන්ජිම සොයා ගැනීම, නාවික හා ජල ප්‍රවාහන ක්‍රම විස්තර කර තිබීම. ● සන්නිවේදන ක්ෂේත්‍රය 1840 පෙනී තැපැල් සේවය / සැමුවෙල්මෝස් විදුලි පණිවිඩ ක්‍රමය, ගුග්ලිමෝ මාකෝනි ගුවන් විදුලි තරංග පණිවිඩ යැවීමේ ක්‍රමය (ල.05) iv. කාර්මී කරණය ව්‍යාප්තියට හේතු, සීඝ්‍ර ජනගහනය නිසා භාණ්ඩවලට තිබූ ඉල්ලුම ඉහළ යාම, යුරෝපය තුළ ගමනාගමන හා ප්‍රවාහන කටයුතු වල වර්ධනය ප්‍රංශය හා ජර්මනිය ගල් අඟුරු සොයා ගැනීම. ⋆ යහපත් ප්‍රතිඵල : වෙළඳ හා වානිජ කටයුතු පුළුල් වීම. / කර්මාන්ත වේගයෙන් බිහිවීම / නගරවල රැකියා සුලභ වීම. ⋆ අයහපත් ප්‍රතිඵල : නිර්ධන පන්තියක් බිහිවීම. / සේවක වැඩ වර්ජන / වෘත්තීය සංගම් බිහිවීම (ල.06)


(09) i. (1) ඉංග්‍රීසි ජාතික විලියම් හාවේ (2) ස්විස් ජාතික පැරසල්සස් (3) ස්විස් ජාතික මයිකල් සර්වෙක්ස් (ල.03) ii. A. ලෞකික රසවින්දනය ඇතිකරන නිර්මාණ බිහිවීම, ධනවතුන්ගේ රූප චිත්‍රයට නැඟීම, කිරිගරුඬින් ප්‍රතිමා නෙලීම, ඒ යටතේ පියෙටා රුව මෝයෙස්ගේ ප්‍රතිමාව දැක්විය හැක. B. පොත් පත් වලට පමණක් දැනුම සීමා නොකරගෙන විද්‍යාත්මකව විවිධ දේ පිළිබඳව සෙවීම, උදාහරණ ඉර හඳ හා තාරකා පිළිබඳ නිරීක්ෂණය කිරීම, විශ්වය පිළිබඳ නව මත ඉදිරිපත් කිරීම. (උදාහරණ : පෘථිවිය ගෝලාකාර බව අනෙක් ග්‍රහලෝක සූර්යයා වටේ පරිභ්‍රමණය වන බව සොයා ගැනීම, ගුරුත්වා කර්ෂණ නියමය සොයාගැනීම ආදිය විද්‍යාත්මක ක්ෂේත්‍රයේ කළ සොයාගැනීම්ය.) iii. නාවික ගමන් වල සුරක්ෂිතව යෙදීමට හැකි මාලිමා යන්ත්‍රය උතුරු තරු මාපකය නිපදවීම. / ලෝකය ගෝලාකාර බව සොයා ගැනීම / ටොලමිගේ ලෝක සිතියම මගින් ලෝකය පිළිබඳ නිසි අවබෝධය / ජාතික රාජ්‍ය ගමන්

සඳහා අනුග්‍රහය දැක්වීම. iv. ⋆ දේශපාලන : ● පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමය බිහිවීම. ● නව නිලධාරී පන්තියක් බිහිවීම. ● පරිපාලන ආයතන පද්ධතිය හඳුන්වාදීම. ● රෝම ලන්දේසි නීතිය හඳුන්වා දීම. ● අධිකරණ පද්ධතියක් ස්ථාපිත වීම. ⋆ ආර්ථික : ● ලන්දේසීන් මෙරට කුරුඳු වගා කිරීම ● බ්‍රිතාන්‍යයෝ කෝපි, සිංකෝනවා, තේ හා රබර් ● ආනයන අපනයන ආර්ථිකයක් බිහිවීම. ● මුදල් භාවිතය ප්‍රචලිත වීම. ● දුම්රිය හා මහාමාර්ග පද්ධතියක් බිහිවීම. ● කොළඹ, ගාල්ල, ත්‍රිකුණාමලය වැනි වෙළඳ නගර බිහිවීම. ● මධ්‍යම පංතියක් බිහිවීම. ⋆ සමාජ සංස්කෘතික වෙනස්කම් : ● මුද්‍රණ කර්මාන්තය හඳුන්වාදීම. ● පොත් පත් සඟරා පුවත් පත් ප්‍රකාශයට පත්වීම. ● පැරණි මුහුදුබඩ ප්‍රදේශ වල රෝමානු කතෝලික ආගම ව්‍යාප්තිය. ● ලන්දේසීන තමන් ඇදහූ රෙපරමාදු භක්තිය ප්‍රචලිත කිරීම. ● බටහිර අධ්‍යාපනය මෙරට ප්‍රචලිත වීම. ● යුරෝපා වාස්තු විද්‍යාව මෙරටට ලැබීම. (කරුණු 03 ට ලකුණු 03, විස්තර කිරීමට ලකුණු 03 = ල.06)

(10) i. (1) ප්‍රංශය (2) මහා බ්‍රිතාන්‍ය (3) රුසියාව (4) ඇමරිකා එක්සත් ජනපදය (යන රටවලින් 03 ක් නම් කිරීමට ල.03) ii. A. ඔටෝ වෝන් බිස්මාර්ක් B. දෙවන විලියම් රජු C. ජර්මන් සෙන්පතියකු වූ වොන් වෝල්ක් D. ප්‍රාන්ස් පර්ඩිනන්ඩ් (ල.04) iii. (1) හිට්ලර් බලවත් වීම හා ඔහුගේ ක්‍රියාකලාපය. (2) ඉතාලියේ මුසෝලිනිගේ ක්‍රියා කලාපය. (3) ජපානයේ ක්‍රියාකලාපය. (4) ජාතීන්ගේ සංගමයේ දුර්වලතා (යනාදියෙන් 02 ක් දැක්වීමට ලකුණු 02 ක් විස්තර කිරීමට = ල.03) iv. (1) සූවස් අර්බුදය (2) ගල්ෆ් අර්බුදය (3) කියුබානු මිසයිල අර්බුදය (යනාදියෙන් 02 ක් නම් කිරීමට ලකුණු 02 + විස්තර කිරීම ලකුණු 04) විස්තර කිරීම : ● සූවස් අර්බුදය : මිසර ජනාධිපති අබ්දුල් ගමාල් නසාර් සූවස් ඇළ ජනසතු කිරීම නිසා ඉන් ප්‍රංශ සමාගම් අපහසුතාවට ලක් වී බ්‍රිතාන්‍ය ප්‍රංශ හමුදා පැවති ප්‍රදේශයට ඒම. ● ගල්ෆ් අර්බුදය : ඉරාක දේශ සීමාවේ තෙල් නිධියකින් කුවේටය තෙල් සොරකම් කිරීම යන චෝදනාවකට ඉරානය කුවේටය ආක්‍රමණය කිරීම. ● කියුබානු අර්බුදය : කියුබානු විප්ලවය අවස්ථාවේ එරමින් එක්සත් ජනපදයට පැනගිය පිරිස් එක්සත් ජනපදයේ පුහුණුව ලැබ පිදෙල් කැස්ත්‍රෝගේ සමාජ වාදී රජයට එරෙහිව ගැටුම් ඇතිකර ගැනීම. මෙම ගැටලුව එක්සත් ජාතීන්ගේ සංවිධානය මැදිහත් වී විසඳීම.

The National e-learning Portal for The General Education

(01) (අ) (i)




(අ) (ii)

